සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන
රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும்
கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business
Development and Underutilized State Resources Development

මගේ අංකය / எனது இல / My No: 07 DSD/HO/05/MF/01/චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல / Your No: ....................

දිනය / திகதி / Date: 2021.06.14

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ :- 2021/14**

සියළුම සමෘද්ධි බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන් / විධායක කමිටු සභාපතිවරුන්,
සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු /බැංකු සමිති කළමණාකරුවන් වෙත,

<u>Covid-19 වෛරස ව්‍යාප්තියේ තෙවැනි රැල්ලෙන් බලපෑමට ලක් වූ සමෘද්ධි බැංකු /බැංකු සමිති ණයකරුවන් සඳහා ණය ආපසු ගෙවීමට සහන ලබා දීම.</u>

1. Covid-19 වෛරස ව්‍යාප්තිය හේතු කර ගෙන සමස්ත ජනතාව මහත් වූ අපහසුතාවයන්ට ලක් වී ඇත.

   එම තත්වය තුලින් සමෘද්ධි ප්‍රතිලාභීන් ඇතුළු සමස්ත ජනතාව covid - 19 වසංගත තත්වයෙන් මුදවා ගැනීමටත්, ඔවුන්ට සහන සැලසීම වෙනුවෙන් රජය විසින් බොහෝ සහන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

   සමෘද්ධි බැංකු/බැංකු සමිති හරහා ව්‍යාපෘති සහ විවිධ කාරණාවන් සඳහා ණය පහසුකම් ලබා ගත් බැංකු සාමාජිකයන්ට ද මෙම වෛරස ව්‍යාප්තිය හේතු කොට ගෙන සුපුරුදු පරිදි ආදායම් උත්පාදන කටයුතු සහ ජීවනෝපාය කාර්යයන් වල නිරත වීමට නොහැකි වීම හේතු කර ගෙන ආදායම් අහිමි වීම, ආදායම අඩු වීම, ව්‍යාපාර කටයුතු තාවකාලික ව නතර වීම සහ රැකියා වල නිරත වීමට නොහැකි වීම වැනි තත්වයන්වලට මුහුණ පා ඇති බව වාර්තා වේ.

   ඒ තුලින් ලබා ගත් ණය මුදල් ආපසු ගෙවීමට තරම් ආදායමක් නොමැතිවීම නිසා ණයකරුවන් දැඩි අපහසුතාවයකට පත් වී ඇති බව අප වෙත වාර්තා වී ඇත.

   මෙම පසුබිම තුල ණය ආපසු ගෙවීමට සුදුසුකම් ලත් (සත්‍ය වශයෙන් බලපෑමට ලක් වූ) බැංකු /බැංකු සමිතිවල සක්‍රීය ණය කරුවන් ට පහත සහන සැලසීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

2. **සුදුසුකම් ලබන ණයකරුවන් හඳුනා ගැනීම සහ ලබාදෙන සහන.**

සමෘද්ධි බැංකු /බැංකු සමිති සාමාජිකයින් සඳහා මුදා හැර 2021.05.15 දිනට පිටහිටි ණය මුදලක් ඇති සක්‍රීය ණයකරුවන් සියළුදෙනාටම පහත සහන සැලසිය යුතුය.

I. ණයකරුවන්ට ණය ගෙවීමට 2021.05.15 දින සිට 2021.08.31 දක්වා කාලය සඳහා ඉදිරි මාස 3½ ක සහන කාලයක් ලබාදිය යුතුය.
II. 2021.05.15 දින සිට 2021.08.31 දින දක්වා කාලය තුල පිටහිටි ණය මුදලට අය කරන වාර්ෂික පොලී අනුපාතය 6% කි. එම කාලයට පොලිය පමණක් අය කරනු ලැබේ.
III. ඉහත (ii) හි පරිදි පොලිය ගණනය කල පසු එකතු වන පොලී මුදල 2021/08/31 දින හෝ දින 30 ක් තුල සම්පූර්ණයෙන් ගෙවිය යුතුය. ඉන් අනතුරුව ද ණය පොලිය නොගෙවන විටක කල්පසු වූ ණයක් වන අතර, ගිවිසුම්ගත පොලි අනුපාතයට ණය මුදල අයකරගත යුතුය.
IV. සහන කාලය තුල, නොගෙවූ මාසික ණය වාරික ගෙවීමට උපරිම මාස 3½ ක ඉදිරි කාලයක් හෙවත් අතිරේක කාලයක් ලබාදීම. ඒ අනුව මාස 3½ න් ගිවිසුම්ගත කාලය දීර්ඝ කරදීම.
V. සහන කාලය තුල 5% දඩ පොලිය අය නොකිරීම.
VI. කන්න අවසානයේ ගෙවා අවසන් කිරීමට ගත් කෘෂි කාර්මික ණය මුදලක් නම්, ඉහත කී සහන කාලය තුල ණය ගෙවීමට ඇති විටෙක ද ඉහත පරිදි සහන පොලිය ලබාදිය යුතු අතර, ණය මුදල ගෙවා අවසන් කිරීමට ඉදිරි මාස 3½ ක උපරිම කාලයක් ලබා දීම.
VII. සමතලා ක්‍රමය යටතේ පොලිය ගණනය කරන ධනාභිමානී වැනි ණය සඳහා ද වාර්ෂික පොලී අනුපාතය 6% සමතලා ක්‍රමයට පොලිය ගණනය කළ යුතුය. එහිදි අදාල හිඟ මාසික වාරික සඳහා පමණක් නව පොලී මුදල අය කර ගත යුතුය.
VIII. ස්වශක්ති ණය කරුවන් සඳහා මෙම සහනයන් හිමි නොවේ.
IX. මෙම උපදෙස් ලැබීමට පෙර ණය මුදල් ගෙවූ ණය කරුවන්ට මෙම සහනයන් නැවත ගැලපිය යුතු නැති අතර සුදුසුකම් ලත් අය සඳහා ඉතිරි කාලයට එනම් 2021.08.31 දක්වා කාලය ලබාදිය හැක.
X. ණයකරුවන්ට මෙම පණිවිඩය වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී, පාලක මණ්ඩල සාමාජිකයින් සහ ප්‍රජාමූල සංවිධාන නිලධාරීන් මඟින් යැවීමට වැඩසටහනක් සකස් කල යුතුය.
XI. මෙම සහනය කල් පසු ණය කරුවන්ට ලබා දෙන විටක 2021.05.15 වන දින දක්වා හිඟ ණය වාරික සහ ගෙවිය යුතු පොලිය සම්පූර්ණයෙන් ගෙවා අවසන් කල යුතුය.බොල් ණය කරුවන්ට මෙම සහනය හිමි නොවේ.

3. මෙම චක්‍රලේඛය නිකුත් කිරීමත් සමඟ පරිගණක මෘදුකාංගය මඟින් ණය අයකර ගැනීම සිදු කරනු ලබන බැංකු/ බැංකු සමිතිවල ණය ස්වයංක්‍රියාව අයවීම අත්හිටුවනු ලැබේ. ඉන් අනතුරුව පහත පරිදි කටයුතු සිදු කරගත යුතුවේ.

I. SLTS මෘදුකාංගය ක්‍රියාත්මක බැංකුවල පොලි අනුපාතය 6% ට වඩා වැඩි ණය යෝජනා ක්‍රමවල පොලි අනුපාතය 2021.05.15 සිට 2021.08.31 දක්වා වූ කාල පරිච්ඡේදයට 6% ක් ලෙස වෙනස් කර ගත යුතුය.
TBS මෘදුකාංගය ක්‍රියාත්මක බැංකුවල මෙම කාලයට අදාල පොලි අනුපාතය වෙනස් කිරීම මධ්‍යගත ක්‍රමයට කරදෙනු ලැබේ.
II. 2021.09.01 දින සිට ණය වර්ග අනුව නැවත පැරණි පොලි අනුපාතයට පොලිය වෙනස් කරගත යුතුවේ.
III. මෙම සහන කාලයේදී අඩු කල පොලි අනුපාතයට අදාල පොලි මුදල් මෘදුකාංගය මඟින් ස්වයංක්‍රියව සකස් කරදෙනු ලැබේ.
IV. 2021.09.01 සිට මෙම ණය මුදල් අය කිරීම ක්‍රියාත්මක කිරීමේ දී මැයි, ජුනි, ජුලි, අගෝස්තු මාසවල වාරික ඉදිරියට ගෙන යා යුතුය. එහිදි ණය මුදල ගෙවා අවසන් කිරීමට තිබූ කාලය ඉදිරියට යනු ඇත.

V. ස්වයංක්‍රියව ණය අයවීම අත්හිටුවා ඇති කාලය තුල ණය ගෙවීමට ඉදිරිපත් වන ණයකරුවෙකු සඳහා Manual Loan Payment ලෙස ලබාගත යුතුය.
VI. 2021.09.01 දින සිට නැවත පරිගණක පද්ධතිය මඟින් ස්වයංක්‍රියව ණය අයවීම සිදුවේ.

4. 2021.09.01 දින සිට පිට හිටි ණය මුදලට ගිවිසුම් ගත පොලිය ගණනය කර මාසික ණය වාරිකය සමඟ අයකර ගත යුතුය. එමෙන්ම සහන කාල සීමාව තුල සහනය ලබා දෙන ණය කරුවන්ගෙන් අය කර ගත යුතු සහ අය වූ මුදල් සම්බන්ධව ණය තොරතුරු රෙජිස්තරයේ සටහන් කිරීමක් සිදු නොවන අතර ණය මුදල අයවීමේ දී ඒ සම්බන්ධව සටහන් තැබිය යුතුය.

5. වාර්ෂික පොලි අනුපාතය 6% හෝ ඊට අඩුවන අනුපාතයට ලබාදුන් ණය සඳහා මෙම සහන පොලිය අදාල කරගත යුතු නැති අතර, එම ණය වැඩසටහනට බලපවත්වන පොලි අනුපාතය තවදුරටත් වලංගු කර ගත යුතුය. එම ණයකරුවන්ට ණය වාරික ගෙවීමට පමණක් ඉදිරි මාස 3½ ක් ලබාදිය හැක. (2021 සැප්තැම්බර් මස සිට )

6. ඉහත කී පරිදි හිඟ පොලි මුදල ගෙවා අවසන් කර ඇති ණයකරුවන් අයත් කණ්ඩායමේ අනිකුත් සාමාජිකයින්ට නව ණය ලබාදීමට මෙයින් බාධාවක් නොමැත.

7. මේ සම්බන්ධව වැඩිදුර විස්තර සඳහා පහත අංශ වලින් විමසන ලෙස දන්වමි.

ප්‍රජාමූල බැංකු අංශය :- 0112887301 / 0112887489
තොරතුරු තාක්ෂණය අංශය :- 0112861213

8. මෙම සහන වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට ඔබ සැම දක්වන සහායට ස්තුතිවන්ත වෙමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.
6. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.